හර්ෂ සේනාධීර

නිර්මාණයන් බිහි කරනා නිර්මාණකරුවන් අද බහුලය. එහෙත් ප්‍රේක්ෂක හදවත්වල සියුම් තැන් පවා ස්පර්ෂ කළ හැකි සෞන්දර්යවාදී නිර්මාණකරුවන් අපට ඇත්තේ දෑතේ ඇඟිලිවලටත් අඩු ප්‍රමාණයක් බැව් සිතේ. වාණිජ ධාරාවේ තිබිය යුතු ආකර්ෂණය, අපූර්වත්වය සමඟ නොනැසෙන නිර්මාණශීලබව අඩුවක් නැති මේ සෞන්දර්යවාදී නිර්මාණ ශිල්පියා කැලුම් පාලිත මහීරත්නය. මේ දිනවල හිරු ටී.වී නාළිකාවේ විකාශය වන අතිශය ජනප්‍රිය 'ස්නේහා' ටෙලි නාට්‍යයේ අධ්‍යක්ෂවරයා මෙන්ම නිෂ්පාදකවරයාද ඔහුය.

අදින් වසර 30කට පෙර ජාතික රූපාහිනියෙ" නිෂ්පාදක තනතුරකට කැලුම්ට අවස්ථාව ලැබෙන්නේ, පාසල් කාලයේ සිටම කලාවට ඔහු තුළ වූ කැමැත්තත් එයට සම්බන්ධ වන්නට තිබූ හීනයත් සපථ කරමින් වුවද, තමාට ලැබුන තනතුර අත්දැකීම් රහිතව භාර ගන්නට තරම් කැලුම්ගේ සිත තනතුරට ගිජු නොවිනි. තමා නියැලෙන කාර්යයේ මූලකැරු පවා ඉගෙනුම මතින් ක්ෂේත්‍රයේ රැදෙන්නට ඔහුට අවැසි විනි.

මට හිතෙනවා ස්නේහා මේ තරම් ජනප්‍රිය වෙන්න හේතුවත් ගැහැනිය ප්‍රමුඛ කර ගැනීම කියලා.අපේ රටේ ආදරය, විවාහය, විශ්වාසය කියන සාධක තුන ගිලිහිලා ගිහින්, ජීවිතය විඳවන කාන්තාවන් කෙතරම්ද, භෞතික සිද්ධි හේතුවෙන්, ඉහත කාරණා අවසඟ වෙලා,ජීවිතයේ අභියෝගයන්ට මුහුණ දෙන ගැහැණිය හරි ප්‍රබලයි. මතු පිටින් සියුමැලි ඇය තමන් විඳින, විඳවන අත්දැකීම් සමඟ ජීවිතය ජයගන්නට උත්සහ කරනවා. ස්නේහා ඒ වගේ.
ඇත්තටම අසංක සායක්කාර කියන මෙහි පිටපත් රචකයාව මං මතක් කළ යුතුයි. ඔහු දක්ෂයෙක්, ඔහුට අධ්‍යක්ෂවරයාව ඉතාම හොඳින් හඳුනා ගත හැකි බවත් ඉලක්ක ගත ප්‍රේක්ෂක පිරිස හඳුනා ගත හැකි බවත් ඉතාම වටිනවා.
සොඳුරුව ගලා යන ස්නේහා සමඟ ජීවත් වෙද්දී මුහුණ දෙන සිද්ධි සොඳුරුම නොවේ මම, මගේ නිර්මාණයකට එකතු කර ගන්නේ තමා සිටින ක්ෂේත්‍රයේ ප්‍රවීණ යැයි සමාජයෙ" රැඳෙන ශිල්පීන්ව. ඇත්තටම තමන් කරන කාර්යය ප්‍රවීණත්වයෙන් කරන අය ඉන්නවා. නමුත් වර්තමානයේ සමහර නළු නිළියන් නිර්මාණයකට එකතු වෙද්දි වගේ නෙවෙයි, වැඩ කරගෙන යද්දි, ඒ ප්‍රවීණත්වය ගිලිහිලා.රංගනයට ඔවුන් අති දක්ෂයි කියන දේ නෙවෙයි මම මේ කියන්නේ. සමහරුන් තුළ තියන



# අද බොහොමයක්, වෘත්තීය ගරුත්වය නැති නළු නිළියන්

## කැලුම් පාලිත මහීරත්න

අපූර්වත්වයක තරම ..............

කැලුම්ට ගුරු වූයේ රිදී තිරයේත් පුංචි තිරයේත් නිර්මාණශීලී පතාක යෝධයකු වූ ටයිටස් තොටවත්තයන්ය.

"මම ටයි මහත්තයා එක්ක අවුරුදු 5ක් වැඩ කළා. ඒ කාලය තුල මේ මාධ්‍ය තුළ පෞරුෂය රැකගෙන ජීවත් වෙමින්, මේ නිර්මාණයන් කළ යුත්තේ කොහොමද කියලා ඉගෙන ගත්තා. ඔහු තුළින් මා ලද දැනුම අපමණයි. අද මා මේ සිටින තැනට මූලික ශක්තිවන්ත අඩිතාලම වැටුනේ ඔහුගෙන් මා ලද ආභාසයයි."

මේ දිනවල විකාශය වන ස්නේහා ගැන කැලුම් කතා කළා.



**ස්නේහා ටෙලි නාට්‍යයට නිෂ්පාදනයෙන් හවුල් වෙන්නෙ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර කරූ කටුවන්දෙණියයි**

"ඇත්තටම මේ මෑත කාලයේ රූපවාහිනී නාළිකාවන්ට ටෙලි නාට්‍යයක් නිර්මාණය කිරීම තරම් අභියෝගයක් වන වෙනත් දෙයක් නැති තරම්. යම් යම් අදිසි හස්ත නිසා ඉතාම හොඳ මට්ටමේ ටෙලි නාට්‍යය පවා ප්‍රතික්ෂේප වෙනවා. ඒ නිසාම නිර්මාණකරුවන් මූල්‍යමය වශයෙනුත්, මානසික වශයෙනුත් ඇඳ වැටෙනවා. නමුත්, හිරු ටී.වී හි සභාපති රෙනෝ සිල්වා මහතාගේ ආරාධනාව මට ලැබුනෙ මෙවන් මොහොතක, මගේ නිර්මාණයන් ගැන, විශ්වාසයක් ඔහු තුල තිබෙන්නට ඇති. එතුමාගේ මේ කතා සංකල්පය නිර්මාණයක් විදිහට එළි දකින්න,රෙනෝ



සිල්වා මහතා වගේම ධම්මික තෙන්නකෝන් සහ විරාජ් වැලිවත්ත කියන මහත්වරුන් සමඟ කළ සාකච්ඡා වලින් පසු 'ස්නේහා' ට මා උත්පත්තිය ලබා දුන්නා.
'ස්නේහා' සත්තකින්ම සොඳුරු හැඟුම් බර කථා මාලාවකි. ආදරය ජීවිතය කරගත් ගැහැනිය,ඒ ආදරය නිසාම ජීවිතය විඳවමින් අනේක විධ අත්දැකීම් වලට මුහුණ දෙයි.එයම ජීවිතය ජයගන්නට අද පන්නරයක් කර ගනියි.

ස්නේහා සමඟ කැලුම් හා සම නිෂ්පාදනය කරන කරූ කටුවන්දෙනිය ගැන ඔහු විශේෂයෙන් සඳහන් කළා. ඇත්තටම කරූ කියන්නේ ඔස්ට්‍රේලියාවේ ජීවත් වන මගේ යාළුවෙක්. ඔහු 'ස්නේහා' හි සම නිෂ්පාදකවරයා ලෙස කටයුතු කරන්න මාත් එක්ක එකතු වුනේ මගේ නිර්මාණයන් වගේම පෞද්ගලිකව මා කෙරෙහි තිබූ විශ්වාසයෙන්, ඒකට මම ඔහුට ස්තූති වන්ත වෙනවා.අනිත් කාරණාව තමයි, ඔහු නිෂ්පාදනයෙන් මේ සඳහා දායක වන්නේ,වෙනත්

වෘත්තීය ගරුත්වය නැහැ කියන එක ගැනයි කතා කරන්නේ. නිර්මාණයකට ආරාධනා කළාම තියෙන ගති ස්වභාවය නෙවෙයි, නිර්මාණය හා එක්ව වැඩ කරද්දී. විවිධ ගැටලු. පළවෙනිම දේ එයාලා හිතනවා එයාලා මේකට අත්‍යවශ්‍යයයි කියලා. ඉතින් විවිධ නීති හදාගෙන අනිත් ශිල්පී න්ව, තමන්ගෙ ගොඩට දාගන්න උත්සහ කර ගන්න අය ඉන්නවා. ඒත් ඒකෙන් වෙන්නේ, තමාම තමාට වළ කපා ගැනමයි. ඒ අය කොච්චර දක්ෂ වුනත් පැවැත්මක" නැහැ.

කිසිම පෞද්ගලික ප්‍රතිලාභයක් බලාගෙන නෙවෙයි. ඒ වගේම නිර්මාණයට අනවශ්‍ය ඇඟිලි ගැසීම් නැහැ.ඒ අවබෝධය මට ඉතාම වටිනවා.

නිලම්බරේ' කැලුම් අධ්‍යක්ෂණය කළ සොඳුරු චිත්‍රපටයයි. රන්ජන් රාමනායක හා හා පුරා හොඳම නළුවා ලෙස සම්මානනීය වන්නේ එයිනි.
ඔව්, නිලම්බරේ තුළින් රන්ජන් හොඳම නළුවා වුනා වගේම, මා අතින් නිර්මාණය වුන සුන්දර, ආකර්ෂණීය චිත්‍රපටයක් එය. අඩු පහසුකම් තියෙන්න ඇති. ඊනියා විචාරයන්ගෙන් ඔබ්බට ගියහම ජීවිතය විඳින්නට චිත්‍රපට නරඹන ප්‍රේක්ෂකයන් තුළ නොමැකෙන මතකයක් රඳවන්නට මම සමත් වුනා කියන සතුට මට දැනෙනවා අදටත් ඒ වෙනුවෙන් ලැබෙන ප්‍රතිචාර දැක්කහම.

**'ස්නේහා' හි ස්නේහා වන උපේක්ෂා ගැන කතා නොකොළොත් එය අඩුවක්**

ඇත්තටම උපේක්ෂාව ගනිද්'දි විවිධ අදහස් මට ලැබුනා. ඈ සමඟ වැඩ නොකළ කෙනෙක් විදිහට මගේ හිතේ චකිතයක් ඇති නොවුනම නෙවෙයි. ඒත් මේ දේ සඳහන් නොකොළොත් මම වැරදියි. ඇත්තටම උපේක්ෂා තරම් තම වෘත්තීය ගරුත්වය ආරක්ෂා කරගෙන තම කාර්යය කරන කෙනෙක් නව පරපුරේ තව ඉන්නවද කියලා හිතෙන තරමටම ඈ සහයෝගීශීලියි. තමා කරන කාර්යය වෙනුවෙන් උපරිමයෙන් කැපවෙමින්, අනවශ්‍ය ප්‍රශ්න ඇති නොකරගෙන, ඔැහ ඉදහ ගේ ඉඳලා අධ්‍යක්ෂවරයා දක්වාම ඉන්න අයට බොහොම ගරුත්වයක් දෙමින් ඇය වැඩ කරනවා. ඇත්තටම ඒ ගැන සතුටුයි මට.

**සුගලා දේවිය ඓතිහාසික ටෙලි නාට්‍යයකට මේ වන විට කැලුම්ට ආරාධනා ලැබිලා.**

ඔව්, ඒ සඳහා ලැබුනු ආරාධනාව අනුව, පර්යේෂණාත්මකව, ආකර්ෂණීය ලෙස එය නිර්මාණය කරන්න සූදානම් වෙනවා. එය යථා කාලයේදී චිත්‍රපටියක් ලෙසිනුත් මා අතින් නිර්මාණය වේවි.

